පොහොර චක්‍රලේඛ අංක - 27

අපේ අංකය:-සමිති/පොහොර/01

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

අංක 70, පාර්ලිමේන්තු පාර,

පැලවත්ත, බත්තරමුල්ල.

2021.09. 21

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන්,

**<u>කුඩා තේ ඉඩම්වල ඩොලමයිට් භාවිතය දිරිගැන්වීම සඳහා සමිති මගින් සහනාධාර සහිතව ඩොලමයිට් නිකුත් කිරීම.</u>**

තේ ඉඩම්වල ඵලදායීතාවය ඉහල නැංවීම වෙනුවෙන් භාවිතා කරන පොහොර වර්ගවල උපයෝජනය වැඩි කිරීම සහ තේ වගා භූමියෙහි පාංශු ආම්ලිකතාවය නිවැරදි කරගැනීම වෙනුවෙන් නිර්දේශිත පරිදි ඩොලමයිට් භාවිතය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ අවශ්‍යතාවයක් සේ සලකා සමිති මගින් කුඩා තේ වතු හිමියන්ට ඩොලමයිට් පොහොර 50kg මිටියකට රු.50 ක සහනාධාරයක් සහිතව නිකුත් කිරීමට තීරණය කරඇත.ඊට අදාලවන මෙහෙයුම් උපදෙස් පහත පරිදි වේ.

1. ගොවින්ගේ ඩොලමයිට් අවශ්‍යතාව මත එහි වටිනාකම හා ප්‍රවාහන ගාස්තුවද සහිතව මුදල් එකතු කිරීමෙන් පසු අවශ්‍ය ඩොලමයිට් ප්‍රමාණය නිර්දේශිත නිෂ්පාදන සමාගමෙන් මිලදීගෙන සමිතිය විසින් ගොවීන් වෙත ප්‍රවාහනය කරදිය යුතුය.

2. ඩොලමයිට් මිටියක සැපයුම් මිලෙන් රු.50 ක් වටිනාකම අඩුකොට මුදල් අයකර සෘජුවම ගොවියාට සහනාධාරය හිමිවනසේ සමිතිය විසින් මුදල් රැස්කිරීම කලයුතුය.

3. එසේ සමිතිය විසින් ගොවි ඉල්ලුම මත ලබාදෙන ඩොලමයිට් අවශ්‍යතාව සහිත නාම ලේඛනය තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ නිර්දේශ සහිතව ප්‍රාදේශීය කළමනාකරුට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රාදේශීය කළමනාකරුගේ නිර්දේශයට අනුව අදාල ඇනවුම සමග අමුණා ඇති නාම ලේඛන හා මුදල් බදින ලද කුවිතාන්සිය මිලදී ගැනීමට අපේක්ෂිත සැපයුම්කාර සමාගමට ලබාදී අදාල සමිතියට ඩොලමයිට් ප්‍රවාහනය කරවා ගතයුතුය.

4. ප්‍රාදේශීය කළමනාකරු විසින් පොහොර මුදල් ලබාගෙන සමිතියට කුවිතාන්සියක් නිකුත් කල යුතුය.අදාල කුවිතාන්සිය හා ඩොලමයිට් අවශ්‍යතා නාම ලේඛනය අදාල සැපයුම්කාර සමාගමට සමිතිය විසින් ඉදිරිපත්කොට පොහොර ප්‍රවාහනය කරදීමෙන් ඉල්ලුම්කරුවන් අතර බෙදාදී බෙදුම් ලේඛණය ප්‍රාදේශීය කළමනාකරුට ඉදිරිපත් කලයුතුවේ.

5. ප්‍රාදේශීය කළමනාකරු විසින් බෙදුම් ලේඛනය අනුව පරීක්ෂාකරබලා වට්ටම(රු.50) සහිතව පොහොරවල මුලු වටිනාකම සහිතව චෙක්පත් අදාල සමාගමට නිකුත්කල යුතුය.

6. සමිතිය විසින් ගෙන්වා බෙදාහරින සෑම ඩොලමයිට් ටොන් 1 කටම රු.100/= ක මෙහෙයුම් දීමනාවක් සමිතියට ලබාදීම කලයුතුය.තේ වගා බිම් වල පවතින පාංශු ph පරාසයන්ට අනුව පසේ ආම්ලිකතාව නිවැරදි කිරීමේ අවශ්‍යතාවය මත ඉහත උපදෙස් අනුව සියලුම සමිති නිලධාරීන් දැනුවත්කර දිස්ත්‍රික් සමිති සංවිධානයේ සහය ලබාගෙන ඩොලමයිට් භාවිතය දිරිගැන්වීම වෙනුවෙන් විශේෂ අවධානය යටතේ අවශ්‍ය පියවරගත යුතුබව මෙයින් දන්වමි.

ආචාර්ය එම්.එස්.ටී. ප්‍රියදර්ශන
සභාපති
21/09/2021

පිටපත්:-

01.සාමාන්‍යාධිකාරී
02.නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ව්‍යාප්ති)
03.අභ්‍යන්තර විගණක
04.කළමනාකරු (සංවර්ධන/මානව සම්පත්/මුදල්/සැලසුම් හා නියමුකරණ)
05.සියලුම මාණ්ඩලික නිලධාරීන්
06.සියලුම කලාප තේ සංවර්ධන නිලධාරීන්
07.සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
08.ගරු ලේකම්/ගරු සභාපති සමස්ත ලංකා සමිති සංවිධානය